# පුරාණ උත්තරාරාමය හෙවත් පොළොන්නරුවේ ගල්විහාරය

*ඩී.එම්. නදීර හර්ෂජිත් දිසානායක*

## ප්‍රවේශය

ලංකාවේ උතුරුමැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පුරාණ පොළොන්නරු නගරය තුළ මෙම ඓතිහාසික ස්ථානය පිහිටා තිබේ. නිරපේක්ෂ පිහිටීම අනුව උතුරු අක්ෂාංශ 7.966020 ද නැගෙනහිර දේශාංශ 81.004993 ද යන ස්ථානයේ ස්ථානගත වේ. පොළොන්නරු ඇතුල් නගරයෙන් උතුරු දිශාවට වන්නට පිහිටි ස්වභාවික පාෂාණ උද්ගතයක් පදනම් කරගනිමින් මෙම විහාරය ඉදිකර ඇත. මෙම පාෂාණ උද්ගතය ජේතවනාරාමයේ උතුරු කෙළවර සීමාවේ දකුණු බටහිර දෙස සිට උතුරු නැගෙනහිර දක්වා විහිදෙයි.[1] දෙමළ මහා සෑයේ සිට මීටර් 320 පමණ දුරකින් පිහිටා තිබෙන උත්තරාරාමය එය වටා පිහිටි තැනි බිමේ සිට අඩි 30 ක් පමණ උපරිම උසකට විහිදෙන පර්වතයක නිමවා තිබේ. පර්වත පෘෂ්ඨය එහි මතුපිට සිට සමස්තයක් ලෙස ගත් විට අඩි 15 ක් පමණ කපා ප්‍රතිමා සමූහය කරවා ඇත.[2]

## ඓතිහාසික පසුබිම

පොළොන්නරුවේ ගල් විහාරය නැතහොත් උත්තරාරාමය යනුවෙන් හඳුන්වන විහාරය මූලාශ්‍රගත තොරතුරු අනුව පොළොන්නරු රාජධානි සමයේ දී ඉදිකරවන්නට ඇති බව පැහැදිලි වේ. ක්‍රිස්තු වර්ෂ 12 වැනි සියවසේ දී පොළොන්නරුවේ සිහසුනට පත්වන පළමු වැනි පරාක්‍රමබාහු රජු සමස්ත ලංකාද්වීපය ම ඒකඡත්‍ර කරවීමෙන් අනතුරු ව ඔහු විසින් ආර්ථික, ආගමික හා දේශපාලනික සේවාවන් රාශියක් කරවන ලද බව වංසකතා සාක්ෂි දරයි. ඒ අතර මේ රජ තෙමේ බලකොටුවට නුදුරින් ආළාහන පිරිවෙන ඇතුළු සුවිසල් ආරාමික ඉදිකිරීම් කර වූ බව කිය වේ. මහාවංසයේ 78 වැනි පරිච්ඡේදයේ 78-81 යන ගාථා වලින් කියවෙන ආකාරයට ගල්විහාරය ද පළමු වැනි පරාක්‍රමබාහු රජුගේ නිර්මාණයක් බව පැහැදිලි ය.

> **"(78) . . . . එසේ ම නරේශ්වර තෙමේ මහා චෛත්‍යයට ආසන්න තන්හි පර්වතය බිඳුවා එහි උත්තරාරාමය (79) කරවුයේ ය. සියලු කර්මයන් දක්වා විද්‍යාධර ගුහාව ද, වැඩහුන් පිළිම ලෙනක් ද, හොත් පිළිම ගුහායෙක් දැයි මෙසේ ලෙන් තුණක් ද දක්ෂ වූ (81) ශිල්පීන් ලවා කරවූයේ ය. . . ."**

1 ඩී. ගම්ලත්, බුද්ධ ප්‍රතිමාගෘහයේ අවකාශීය සංවිධානය, (කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම, පී. ද ඇස්. කුලරත්න මාවත, 2016), 684 පිට.

2 H.C.P.Bell, **Archaeological Survey of Ceylon**, (Colombo: Annual Report, Department of Archaeological Survey of Sri Lanka. 1907), 10 p.

මහාවංස විස්තරයට අනුව වර්තමානයේ ගල්විහාරය යනුවෙන් හඳුන්වන විහාරය එකල උත්තරාරාමය නම් වූ බව ඒ අනුව පැහැදිලි වේ. ඇතුල් නගරයට උතුරින් පිහිටා තිබීම කරණ කොට උත්තරාරාමය යනුවෙන් නම් කෙරෙන්නට ඇත. පරාක්‍රමබාහු රජු විසින් තෝරාගන්නා ලද ගල් පර්වතය තුළ ගුහා දෙකකින් හා එක් ලෙනකින් යුක්ත විහාර සැලැස්මක් වූ අතර ගුහා දෙක විජ්ජාධර ගුහාව හා නිපන්නපටිමා ගුහා ලෙස ද නිසින්නපටිමා යනුවෙන් ලෙන ද හඳුන්වා තිබේ. රජු විසින් මෙම ස්ථානයේ ප්‍රතිමා කරවීමට මෙම පාෂාණ උචිතදැයි පරීක්ෂා කිරීම සඳහා ශිල්පීන්ට අණ කළ බවත් ඒ අනුව ඔවුන් විසින් බද්ධ සීමා ප්‍රාසාදයට පහළින් පිහිටි පාෂාණය මත පිළිම කර පරීක්ෂා කළ බවත් ජනප්‍රවාද තොරතුරුවල එයි. මෙම ස්ථානය පුංචි ගල් විහාරය යනුවෙන් හඳුන්වන ස්ථානය විය හැකි බවට මතවාද පවතී. එහි කුඩා ගල් ලෙන් දෙකක වැඩ නිම නොකරන ලද පිළිම කිහිපයක් දැකිය හැකි නමුත් ඉහත ජනප්‍රවාදගත තොරතුරු සනාථ කරන පුරාවිද්‍යාත්මක සාධක මෙතෙක් හමු වී නොමැත.

ක්‍රිස්තු වර්ෂ 12 වන සියවසෙන් පසු ව මෙම ඓතිහාසික ස්ථානය පිළිබඳ ව නැවත තොරතුරු ලැබෙන්නේ එයින් සියවස් 6 කට අනුක්‍රමයෙනි. එනම් ක්‍රිස්තු වර්ෂ 19 වැනි සියවසේ බ්‍රිතාන්‍ය යටත් විජිත අවධිය තුළ ය. එවකට මෙම ප්‍රදේශය ඝණ කැළෑවක් බවට පත් ව තිබූ බව එම අවධියේ වාර්තාවලින් පැහැදිලි වේ. මුලින් ම ගල්විහාරය පිළිබඳ වාර්තාකරනු ලබන්නේ ලෙප්ටිනන් ෆෝගන් **(Lieut. Fagan)** විසිනි. ඒ 1820 වසරේ දී වන අතර ඔහු වනයේ සංචාරය කරන අතරතුර සුවිසල් ප්‍රතිමා දැක විස්මයට පත් වූ බවත් එම හැඟීම වචනවලින් ප්‍රකාශ කිරීම අපහසු බවත් දක්වා තිබේ.[3] ගලින් කරවූ ප්‍රතිමා හේතුවෙන් හෙතෙම මෙම ස්ථානය ගල්විහාරය යනුවෙන් හඳුන්වා ඇත. විහාරයේ බුද්ධ ප්‍රතිමා පිළිබඳ කෙටි විස්තරයක් ද සපයන අතර ෆෝගන්ගේ මෙම කාර්යය අනෙකුත් ඉංග්‍රීසි ජාතිකයින්ගේ අවධානයට මෙම ස්ථානය පාත්‍ර කරවන්නට සමත් විය.

1841 වර්ෂයේ දී මේජර් ෆෝබස් (Forbes) විසින් ගල්විහාරය ඉසුරුමුණිය ලෙස සාවද්‍ය ලෙස හඳුනාගනු ලැබිණි. කෙසේ නමුත් ඔහු මෙම විහාරය පළමු වැනි පරාක්‍රමබාහු රජුගේ නිර්මාණයක් බව නිවැරදි ව පෙන්වා දෙන ලද්දේ ය.1855 දී සැමුවෙල් බේකර් විසින් ගල්විහාරය නරඹා විස්තරයක් ද සපයා තිබේ. ඔහු විසින් ලෙනෙහි වූ බුදු පිළිමය ඉතා අනර්ඝ නිර්මාණයක් ලෙස සැළකූ අතර අනෙකුත් පිළිම ද බුද්ධ ප්‍රතිමා ම වන බව පෙන්වා දුන්නේ ය.[4]එමර්සන් ටෙනන්ට් (James Emerson Tennent) 1860 දී Ceylon සඟරාවට ගල්විහාරය පිළිබඳ විස්තරයක් සපයා තිබේ. මෙම කලාපය ආශ්‍රිත ව පවතින වැදගත් ම නිර්මාණය ගල් විහාරය වන බව ඔහුගේ මතය විය.[5] එමෙන් ම ඔහු ඉන්දියාවේ අජන්තා හා එල්ලෝරා වැනි ස්ථානවල පවතින ආකාරයට පිහිටි ගලෙහි හාරන ලද ලෙන් සම්ප්‍රදායට නිර්මාණය කර ඇති ලංකාවේ එක ම ස්ථානය ගල් විහාරය වන බව පෙන්වා දෙන ලද්දේ ය. එමෙන් ම සමකාලීන යුරෝපීය නිර්මාණයන්ට වඩා මෙය අග්‍රගණ්‍ය නිර්මාණයක් වන බව පවසන ලදී.

1876 වර්ෂයේ දී ජේ. ෆර්ගසන් විසින් ගල් විහාරය නරඹා ඇති අතර ඒ පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් ද සපයා තිබේ. මෙය පොළොන්නරුවේ පැරණිතම නැතිනම් වැදගත් ම විහාරය වන බවයි ඔහුගේ අදහස වූයේ. ගල් විහාරයට සමාන කළ හැකි චෛත්‍යය ශාලා හෝ ආවාස ගුහා ඉන්දියාවේ හෝ දැකගත නොහැකි බව ඔහු පවසා තිබේ. එමෙන් ම ගල් විහාරයේ සැතපෙන පිළිමය තරම් විශාල පරිනිර්වාණ ප්‍රතිමාවක් ඉන්දියාවේ නොමැති බව ද ෆර්ගසන් විසින් විස්තර කර ඇත.

ඉන් පසු ලංකාවේ ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස්වරයා බවට පත් වන එච්.සී.පී. බෙල් (H.C.P. Bell) විසින් ඔහුගේ 1907 වාර්ෂික පුරාවිද්‍යා පාලන වාර්තාවේ ගල් විහාරය පිළිබඳ ඉතා වැදගත් තොරතුරු රාශියක් සපයා තිබේ. මෙහි දී ඔහු විසින් ගල් විහාරයේ ප්‍රතිමාගෘහ පර්වතයේ වම්පස සිට අංකනය කර තිබෙන අතර ඒ අනුව අංක 01 ප්‍රතිමා ගෘහය ලෙස විශාල සමාධි පිළිමය සහිත ගෘහය නම් කරනු ලබයි.[6]මෙම ගුහාව මහාවංසය හඳුන්වන්නේ විද්‍යාධර ගුහා යනුවෙනි.[7] බෙල් ගල් විහාරය

---

4 සී.වික්‍රමගමගේ, **පොළොන්නරුවේ ගල්විහාරය**, (කර්තෘ ප්‍රකාශනයකි 2011). 4-5 පිටු.

5 Tennent, 1860

6 H.C.P. Bell, **Archaeological Survey of Ceylon**, (Colombo: Annual Report, Department of Archaeological Survey of Sri Lanka. 1907).

7 **මහාවංසය** (සිංහල) (සංස්:) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, (කොළඹ: සංස්කෘතික අමාත්‍යංශය, 1986). 78 පරි, 78-81 ගාථා


පිළිබඳ තමන්ට පූර්වතමයන්ගේ ද අදහස් සහිත ව දීර්ඝ විස්තරයකින් ගල් විහාරයේ නිර්මාණාත්මක අගය පිළිබඳ ව සාකච්ඡා කර තිබේ.

ගල කපා තනන ලද මේ කළු ගල් විහාරය පැහැදිලි ව ම එහි විශේෂ ලක්ෂණ අනුව අසම නිර්මාණයකි. මෙය ශ්‍රී ලංකාවේ බෙහෙවින් ම කැපී පෙනෙන අති විශිෂ්ඨ නිර්මාණයකි. ඊට සම කළ හැක්කක් ඉන්දියානු උප මහද්වීපයේවත් නැත.[8]

මින් පසු කාලීන ව ගල් විහාරය පිළිබඳ ලාංකික පුරාවිද්‍යාඥයින්ගේ අවධානය යොමු වනු දැකිය හැකි ය. ඒ අනුව 1956 දී ඩී.ටී. දේවේන්ද්‍ර විසින් ගල් විහාර හිටි පිළිමය (The Standing Figure at the Galvihara) මැයෙන් ලිපියක් ලියන ලදී. එමෙන් ම මහාචාර්ය පී.ඊ.ඊ. ප්‍රනාන්දු 1960 දී ගල් විහාරයට තන්ත්‍රයාන බෞද්ධ බලපෑම පිළිබඳ ව ලිපියක් රචනා කරන ලදී. මෙම ලිපියේ කරුණු පිළිබඳ විවේචනාත්මක අදහස් දැක්වීමක් 1971 දී නන්දසේන මුදියන්සේ විසින් සිදු කරනු ලැබීය. එම වසරේ දී ම සෙනරත් පරණවිතානයන් විසින් පුරාණ සිංහලයින්ගේ කලාව (The Art of Ancient Sinhalese) කෘතියේ ගල් විහාරය පිළිබඳ වැදගත් විස්තරයක් දක්වනු ලැබීය. ඉන් පසු මහාචාර්ය පී.එල්. ප්‍රේමතිලක ද ගල් විහාරය පිළිබඳ ලිපියක් Artibus Asiae සඟරාවේ විසි අට වැනි කලාපයේ පළ කරවීය. ඊට අමතර ව 2011 වසරේ දී චන්ද්‍රා වික්‍රමගමගේ විසින් ගල් විහාරය මැයෙන් කුඩා පොතක් රචනා කරන ලද අතර 2016 වසරේ දී දනන්ජය ගම්ලත් විසින් බුද්ධ ප්‍රතිමාගෘහයේ අවකාශීය සංවිධානය යන කෘතිය රචනා කරන ලදී. මෙහි ගල් විහාරයේ ප්‍රතිමාගෘහ පිළිබඳව ද මනා විස්තරයක් ඇතුළත් කර තිබේ. ඒ හැරුණු කොට ලංකාවේ ප්‍රතිමා, වාස්තුවිද්‍යා හා කලාත්මක අංග පිළිබඳ ලියැවී ඇති කෘතිවලින් බොහෝමයක ද ගල් විහාරය පිළිබඳ එම තොරතුරු අඩු වැඩි වශයෙන් උකහා ගැනීමේ හැකියාවක් පවතී.

## උත්තරාරාම ප්‍රතිමාගෘහ

මහාවංස තොරතුරු අනුව පළමු වැනි පරාක්‍රමබාහු රජතුමා විසින් උත්තරාරාමයේ ලෙනක් හා ගුහා දෙකක් කර වූ බව කියවේ. මෙම ඉදිකිරීම්වලට අමතර ව තවත් ගුහාවක් උත්තරාරාම සැලසුමට අයත් වේ. මෙම නිර්මාණ සළකා බලන විට ඒවා සියල්ල පර්වතය හාරා කරවන ලද ප්‍රතිමා සහිත කුහර වේ. මෙම ප්‍රතිමා සහිත ඉදිකිරීම ආවරණය කිරීම සඳහා ඉදිරිපසින් කරවන ලද ගඩොල්මය




**උත්තරාරාම බිම් සැලසුම**

උපුටා ගැනීම: වික්‍රමගමගේ,2011, 3 පිට

ව්‍යුහයක් දැකිය හැකි ය. එම ව්‍යුහයන් ප්‍රතිමා ගෘහයන් බවට සැක නැත. රෝලන්ඩ් සිල්වා

8 සී.වික්‍රමගමගේ, පොළොන්නරුවේ ගල්විහාරය, (කර්තෘ ප්‍රකාශනයකි 2011). 06 පිට.

සඳහන් කරන ආකාරයට මෙම ප්‍රතිමාගෘහ ගෙඩිගේ සම්ප්‍රදායට අනුව ඉදිකර තිබේ. පොළොන්නරුවේ ප්‍රතිමාගෘහ සම්ප්‍රදාය ගෙඩිගේ සම්ප්‍රදාය මූලික කරගත් වාස්තුවිද්‍යා සැකැස්මක් දරූ බව ථූපාරාමය, ලංකාතිලකය හා තිවංක පිළිම ගෙය ද අනුව පැහැදිලි වේ. කෙසේ නමුත් ගල් විහාරයේ අංක 1, 3 හා 4 යන ප්‍රතිමාගෘහ සඳහා ගල්කණු භාවිත කර නොමැති බවට එහි බිම් සැලසුම් සාක්ෂි දරයි. ඊට අමතර ව ගඩොල් බිත්තිවල ඝණකම ඉතා වැඩි වීම ද මෙහි පැවතියේ ගෙඩිගේ සම්ප්‍රදාය බව උපකල්පනය කරන්නට කදිම සාධක සපයන්නක් වේ. ගල් විහාර සැලසුම අනුව එහි වම්පස සිට පිළිවෙළින් විජ්ජාධර ගුහාවත් නිසින්නපටිමාලෙන හෙවත් හිඳි පිළිම ලෙනත් හිටි පිළිම ගුහාව හා නිපන්නපටිමා ගුහා හෙවත් සැතපෙන පිලිම ගුහාව ලෙස ද නම් කර තිබේ. මෙහි මින් මතු විස්තර කරන්නේ එම ප්‍රතිමාගෘහ හා ඒවායේ මූර්තිමත් ප්‍රතිමා සහ කැටයම් පිළිබඳ ව ය.

## විජ්ජාධර ගුහාව

මෙම විජ්ජාධර ගුහාව සමාධි ප්‍රතිමාවක් සහිත ප්‍රතිමාගෘහයකි. එය ගර්භගෘහය, අන්තරාලය හා මණ්ඩපය යන අංග ත්‍රිත්වයකින් සමන්විත වේ. ප්‍රතිමාව සහ ගෘහය දකුණු නැගෙනහිර දිශාවට මුහුණලා ඉදිකර තිබේ. ගර්භගෘහය ඇතුළත ධ්‍යාන මුද්‍රාවෙන් ආසනය මත හිඳි බහු උන්නත බුද්ධ ප්‍රතිමාවකි. ප්‍රතිමාව ද ඇතුළත් ගර්භගෘහයේ අභයන්තර දිග පළල මීටර් 6.7 හා 2.8 වේ. මෙය ආයතාස්‍රාකාර හැඩයක් ගන්නා අතර ප්‍රතිමාවේ ආසනය මීටර් 5.5 ක් දිගින් ද මීටර් 1.35 ක් පළලින් ද යුතු ව නිර්මාණය කර ඇත. ඒ අනුව ගර්භගෘහය තුළ ප්‍රතිමාව ඉදිරියේ ඇති වන්දනීය අවකාශය මීටර් 2.8 ක උපරිම පළලකින් සීමා වේ. ගර්භසරය හා ආලින්දය අතර මීටර් 1.8 ක පළලින් යුත් ඉතා පටු අන්තරාලය මීටර් 4.8 ක් දිගින් යුක්තය. ඉදිරිපස ආලින්දයේ දිග මීටර් 4 ක් හා පළල මීටර් 1.6 වන අතර එහි ප්‍රමාණාත්මක බව ගර්භගෘහයට සාපේක්ෂ ව පටු දිගින් වැඩි ස්වරූපයක් ගනී. ගොඩනැගිල්ලට ඇතුළු වන ස්ථානයේ කෙටි දොරටු ප්‍රමුඛයක් පවතින්නට ඇති බවට උපකල්පනය කළ හැකි නමුත් එම සියලු ව්‍යුහයන් අස්ථානගත වී ඇත.[9]

ප්‍රතිමාව ආසන්න වශයෙන් මීටර් 4.6 ක් පමණ උසින් යුක්ත ය. මෙය ලංකාවේ පුරාතන සමාධි ප්‍රතිමා අතර විශාලතම ප්‍රතිමාව ලෙසින් සැළකිය හැකි ය. දණහිස් අතර පරතරය මීටර් 4.5 කි. පිළිමයේ දකුණු උරය විවෘත ව ද වම් අරය වැසෙන සේ ද සිවුර ඒකාංශ පාරුපණ ක්‍රමයට පොරවා තිබේ. සිවුරේ රැළි යුගළ ඇලි ක්‍රමයට නිරූපණය කර ඇති ආකාරයට මෙය පොළොන්නරු යුගයේ ප්‍රතිමා කලාවේ ආවේණික ලක්ෂණයක් ලෙසින් පෙන්වා දිය හැකි ය. දෙපා වීරාසන ක්‍රමයට වම්පස නවා ආසනය මත තිරස් අතට තබා ඒ මත දකුණු පය නවා තිරස් අතට තබා තිබේ. දක්ෂිණාවර්ත කෙස් පිඬු සහිතහිස මුදුනේ උස්නීෂයයි. හිස වටා ඇති බුදුරැස් රංසිජාලය ලෙසින් හඳුනාගත හැකි ය.

ප්‍රතිමාවේ ආසනය ආසන්න වශයෙන් මීටර් 1.3 ක් උසින් යුතු වේ. සාමාන්‍යයෙන් බුදුන් වහන්සේ වැඩහුන් ආසන වර්ග 2ක් වන අතර ඒ වීරාසන හා සිංහාසන යි. ආසනයේ ඉදිරිපස වම් හා දකුණු පැතිවල සිංහරූප පමණක් යොදා ඇත්තම් එය සිංහාසන වන අතර වජ්‍ර සංකේත යොදා ඇත්නම් එය වජ්‍රාසන වේ.[10] නමුත් විජ්ජාධර ගුහාවේ ආසනය ඉදිරිපසත් වම් දකුණුපසත් සිංහරූප මෙන් ම විශ්වවජ්‍ර අල්ප උන්නතයෙන් කැටයම් කර තිබෙනු හඳුනාගන්නට හැකි ය. ආසනය මත ඇතිරූ පළගක් මත බුදුන් වහන්සේ වැඩ සිටිති. එම පළග විවෘත පද්මයක් ලෙසින් නිරූපණය වන ආකාරයෙන් නෙළුම් පෙති මෝස්තරයකින් අලංකාර කර ඇත.

ප්‍රතිමාවේ පිටුපසින් දක්නට ලැබෙන්නේ අනුරාධපුර කලාවේ විරල ව හමුවන මකර තොරණකි. මෙහි සිරස් හා තිරස් පොලු ද ආරුක්කු හැඩයෙන් යුතු ආසනයේ පිට ඇන්දේ මුදුන හා එය දෙපස ඉහළ මහල් හා සම්බන්ධ කොටස් ද මුදුනේ බොකු වහළ ද අල්ප උන්නත ලෙස නිමවා තිබේ. [11] ආසන්යේ දෙපස හා පිටුපස තිරස් හා සිරස් කොටස්වල මල් මෝස්තර නිර්මාණය කර ඇත. ඒ කෙළවර එක් පසකට තුන බැගින් වූ මකර කැටයම් 6 කි. මකර මුවින් සිංහ රුවක් පිටවන ආකාරයෙන් නිමවා තිබේ.

9 ඩී.ගම්ලත්,,**බුද්ධ ප්‍රතිමාගෘහයේ අවකාශීය සංවිධානය**, (කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම, පී. ද ඇස්. කුලරත්න මාවත, 2016). 625 පිට.

10 සී.වික්‍රමගමගේ, **පොළොන්නරුවේ ගල්විහාරය**, (කර්තෘ ප්‍රකාශනයකි 2011). 09 පිට.

11 එම.,

තොරණ මුදුන අර්ධ කවාකාර ආරුක්කු හැඩයේ සංවිධානයකට සරිලන සේ එකක් පතුයෙහි අනෙක පවතින සේ ප්‍රසාදය කරවා ඇත.[12] තොරණ මුදුනේ දීර්ඝ හැඩයේ ආයතසාකාර ප්‍රසාදයක වහළයක් මුදුන් කොත් 3 ක් සහිත ව නිරූපණය කෙරේ. පහලින් ඇති තනි කුටි ක්‍රමයේ ප්‍රසාදවල ගර්භාකාර හැඩයේ තනි මුදුන් කොතකි. මේවායේ ඉදිරි මුහුණතේ කවේනියක් තුළ සමාධි බුද්ධ ප්‍රතිමාවක් බැගින් වේ. මෙහි ඇති ක්ෂුද්‍ර ප්‍රසාදාභිමුඛයන්හි මුදුන් වහළ පොළොන්නරුවේ ගෙඩිගේ සම්ප්‍රදායේ වහළ ක්‍රමවලට සම්පූර්ණයෙන් සමාන වෙයි. ගල්විහාරයේ ප්‍රතිමාගෘහ ද ගෙඩිගේ සම්ප්‍රදායට යමින් ඉදිකරන්නට ඇති බවට උපකල්පනය කරන්නට මෙම සාධක ද ඉවහල් වේ.

විජ්ජාධර ගුහාවේ තේමාවට බුද්ධ ප්‍රතිමා පහක් ඇතුළත් වේ. ප්‍රධාන බුදු පිළිමය වෛරෝචන ධ්‍යානි බුදුවරයා ලෙස ගත් විට ඉහළ විමානවල රත්නසම්භව, අක්ෂෝභ්‍ය, අමිතාභ හා අමෝඝසිද්ධි දිසා නියෝජනය කරන ධ්‍යානි බුදුවරුන් ය. මෙම බුදුවරු පස්නම ම විශ්වව්‍යාපී ධර්මකායට අයත් වේ. බිම් මහළ මැද බුදුරුවේ ආසනයේ පිපුණ පද්මය මත වෛරෝචන බුදුවරයා වැඩසිටීම නිරූපණය වේ. ඒ ආසනය පද්මාසනය වන හෙයින් බුදුන් වහන්සේ ලෝකෝත්තර බව ප්‍රකාශ කරයි. ආසනය මැද තිරස් පොලුවලින් හා මැද මකර කටවලින් එළියට එන සිංහරුව මාර්ගඵල ලබා නිවනට පත්වන බව අදහස් කෙරේ.[13] ඒ අනුව මෙම විජ්ජාධර ගුහාවේ තේමාව ධ්‍යානි බුදුවරුන්ගෙන් යුක්ත නිසා ධ්‍යානි බුදුවරුන් සඳහා භාවිත විජ්ජාධර යන්න ඇසුරෙන් විජ්ජාධරගුහා ලෙස මෙම ප්‍රතිමාගෘහය හඳුන්වන්නට ඇති බව උපකල්පනය කළ හැකි බව වික්‍රමගමගේගේ අදහසයි.[14]

## නිසින්නපටිමා ලෙන

හිඳි යන අදහස දෙන නිසින්න යන්නෙන් හිඳි පිළිමය සහිත ලෙන නිසින්නපටිමා ලෙන නමින් හඳුන්වා තිබේ. මෙය ගල් පර්වතය තුළට හාරා සකස් කරන ලද ලෙනකි. ලෙන තුළ වීරාසන ක්‍රමයට පාද හා ධ්‍යාන මුද්‍රාවට දෑත් ද තබා ගෙන වැඩ සිටින බුදු රුවකි. විශ්වවජ්‍ර හා සිංහ සංකේතවලින් යුක්ත ආසනයේ විවෘත පද්මයක් මත බුද්ධ ප්‍රතිමාව නිමවා තිබේ. ආසනයේ ඉහළ කොටස විජ්ජාධර ගුහාවේ ආසනයේ ඉහළ කොටසට මුළුමණින් ම වෙනස් වන අතර ආසනයේ ඉහළ සිටගෙන සිටිනා සිංහ රූප දෙකකි. ආසනයේ දෙපස චාමර ගත් රූප දෙකක් පවතින අතර ඒවා දේව රූප විය හැකි ය. සිරස් කුලුණුවල මල් මෝස්තර කැටයම් වන අතර ඉහළ තිරස් පොලුවල දෙකොන මකර කට නිරූපණය කර ඇත. සිරස් කුලුණුවලට පිටින් දකුණුපස බ්‍රහ්ම හා වම්පස විශ්ණු සිටිති. ආසනයට ඉහළින් විවෘත ඡත්‍රයකි. ලෙන් බිත්තිවල දේව රූප ඇඳ තිබූ බවට සාධක ශේෂ ව පවතින අතර දූනට දොරටුව දෙපස ඇතුළත බිත්තිවල චිත්‍ර දැකගත හැකි ය. ඒවායේ තරුණ දේවරූප මෙන් ම මහලු අයකුගේ රූපයක් වේ. මහලු මිනිසා අත ශංඛයක් නිරූපණය කරන අතර එය වෛජයන්ත ශංඛය විය යුතු ය. ඒ අනුව මෙම මහලු රුව ශක්‍රයා බව උපකල්පනය කළ හැකි වේ. ශක්‍රයා මහලු වියට පත් ව ආයුශ දීර්ඝ කර ගැනීමට බුදුන් වහන්සේ වෙත පැමිණ ආශිර්වාද ලබා ගන්නා අයුරු මෙමඟින් නිරූපිතය.

## හිටි පිළිමය සහිත ප්‍රතිමාගෘහය

ගල් විහාරයේ තෙවැනි ප්‍රතිමාව සහිත පිළිම ගෙය මෙයයි. මෙහි අඩි 23 කින් යුක්ත හිටි බුද්ධ ප්‍රතිමාවකි. පළමුවැනි පරාක්‍රමබාහු රජු විසින් උත්තාරාරාමය කරවන ලද කතා පුවත දක්වන වංසකතාකරුවන් මෙම හිටි පිළිමට සහිත ප්‍රතිමාගෘහය පිළිබඳ තොරතුරු දක්වන්නේ නැත. එයට හේතුව මෙතෙක් හරිහැටි නිර්ණය කරන්නට පුරාවිද්‍යාඥයින්ට හෝ ඉතිහාසඥයින්ට නො හැකි ව තිබේ. කෙසේ නමුත් මෙම ප්‍රතිමාව සඳහා ද ප්‍රතිමාගෘහයක් නිර්මාණය කර තිබූ බවට පැහැදිලි සාධක හමු වී ඇත. එය පර්වතයට යා කොට ඉහළට බිත්ති බැද තිබූ ඉදිරියට ඇදී යන ස්වරූපයේ දිගින් වැඩි ගොඩනැගිල්ලකි. ගඩොල් බැමි පර්වතය හා බද්ධ කර තිබූ බවට සාධක සපයන කුඩා හතරැස් සිදුරු

12 H.C.P.Bell, **Archaeological Survey of Ceylon**, (Colombo: Annual Report, Department of Archaeological Survey of Sri Lanka. 1907).11p

13 සී. වික්‍රමගමගේ, **පොළොන්නරුවේ ගල්විහාරය**, (කර්තෘ ප්‍රකාශනයකි 2011). 10 පිට.

14 එම.,

හා වැද්දුම් තල ප්‍රතිමාව දෙපසින් හමු වේ. මෙම සළකුණු අවුකන බුද්ධ ප්‍රතිමාව සඳහා කරවන ලද ගෙඩිගෙය සඳහා ද යොදාගත් වැද්දුම් ක්‍රම සමඟ සැසඳේ.[15]

ගර්භගෘහය, අන්තරාලය හා මණ්ඩපය යන අංග ඇතුළත් පිළිම ගෙයට ප්‍රවේශ දොරටු මණ්ඩපයක් ද ඇතුළත් වී තිබේ. ගර්භසරය මීටර් 4×4 ප්‍රමාණයේ එකකි. මණ්ඩපය මීටර් 3.25×2.10 ක් වන අතර ඒ මැද අංග 2 යා කරන පටු අර්තාලයයි. ගොඩනැගිල්ලේ බිත්තියක පළල මීටර් 1.4 පමණ වන අතර එය උස් බිත්ති යෙදූ ගෙඩිගේ සම්ප්‍රදායේ ගර්භගෘහයක් පැවති බවට සාධකයකි. ආලින්දයත් ගර්භග ෘහයත් අතර හරස් බිත්තිය සෙන්ටිමීටර් 80 පමණ වේ. මීටර් 2.6 පළලින් යුත් දොරටු මණ්ඩපයක් පැවත ඇති අතර එහි දැනට ශේෂ ව ඇත්තේ දොරගල පමණකි. බෙල් පෙන්වා දෙන ආකාරයට ගර්භගෘහයේ ගෙබිම ද පර්වතය කපා සකස් කර තිබේ.[16]

හිටි ප්‍රතිමාව නිර්මාණය කර ඇත්තේ පිපිණු නෙළුමක් මත ය. මෙම පද්මාසනය සෙන්ටිමීටර් 60 ක් පමණ උසින් යුක්ත වේ. එහි ආසන්න විශ්කම්භය මීටර් 3.6 ක් වෙයි. ප්‍රතිමාව ත්‍රිභංග (තිවංක) විලාසය පෙන්නුම් කරන අතර මෙය එම වර්ගයේ ප්‍රතිමා අතර විශාලතම ප්‍රතිමාව ලෙසින් සැළකීම සාධාරණ ය. ප්‍රතිමාවේ දෙඅත් පපුව හරහට තබා බැදගෙන සිටින අයුරින් නිරූපිත ය. මෙම හස්ත මුද්‍රාව ලංකාවේ පුරාවිද්‍යාඥයින්ගේ මෙන් ම කලා ඉතිහාසඥයින්ගේ ද මත විවාදයන්ට ලක් කරන ලද්දක් ලෙසින් හඳුනාගන්නට හැකි වේ. මුල් ම වකවානුවේ දී ෆාරර් විසින් මෙම හිටි පිළිමය මෛත්‍රී බුදුන් වහන්සේගේ බව ප්‍රකාශ කර තිබුණ ද ඒ පිළිබඳ වැඩි දෙනෙකුගේ අවධානයක් යොමු වූයේ නැත.[17]ඉන් පසු ව ඇතමුන් විසින් පෙන්වා දෙන ලද්දේ මෙම ප්‍රතිමාවෙන් නිරූපණය කරන්නේ ආනන්ද හිමියන් වන බවයි. එම අදහස ගෙන ආ විද්වතුන් අතර පුරෝගාමියෙකු වූ බෙල් අදහස් කරන ආකාරයට හිටි පිළිමය හා ඊට යාබද සැතපෙන පිළිමය එක ම අවස්ථාවක් නිරූපණය කරන ප්‍රතිමා වන බවයි. එනම් බුද්ධ පරිනිර්වාණ අවස්ථාව නිරූපණය කරන අවස්ථාවයි. ඔහු තවදුරටත් අදහස් දක්වමින් කියාසිටින්නේ මුල්කාලීන ව මෙම ප්‍රතිමා ද්විත්වය ම එක ම ප්‍රතිමාගෘහයක පැවති බවයි. එම ප්‍රතිමා වෙන් කොට බිත්තියක් මඟින් වෙන් කරනු ලබන්නේ පසුකාලීන ව බවයි ඔහු පවසන්නේ. ඔහුගේ අදහසට අනුව බුදුන් වහන්සේගේ පිරිනිවන් මඤ්චකය අසළ දුක්මුසු ව බලාසිටින ආනන්ද හිමියන්ගේ රුව මෙම හිටි ප්‍රතිමාවෙන් නිරූපිත ය.[18]මෙම හිටි ප්‍රතිමාව ආනන්ද හිමිගේ බව 1885 දී බෙල්ට පූර්වයෙන් බරෝස් විසින් ද පවසන ලදී.[19] එම අදහසට බෙල් එකඟ වුවත් ඉන් වසර කිහිපයක් ඉක්ම යන්නට මත්තෙන් හෝකාර්ට් විසින් මෙය බුද්ධ ප්‍රතිමාවක් බව පෙන්වා දෙන ලදී.[20]නමුත් සෙනරත් පරණවිතානයන් විසින් මෙම ප්‍රතිමාව බුද්ධ ප්‍රතිමාවක් ම බව ප්‍රත්‍යක්ෂ කරමින් හේතු දක්වනු ලබයි.

---

15 ඩී. ගම්ලත්, **බුද්ධ ප්‍රතිමාගෘහයේ අවකාශීය සංවිධානය**, (කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම, පී. ද ඇස්. කුලරත්න මාවත, 2016). 686 පිට.


16 H.C.P.Bell, **Archaeological Survey of Ceylon**, (Colombo: Annual Report, Department of Archaeological Survey of Sri Lanka. 1907). 14p

17 සී.වික්‍රමගමගේ, **පොළොන්නරුවේ ගල්විහාරය**, (කර්තෘ ප්‍රකාශනයකි 2011). 51 පිට.


18 H.C.P.Bell, **Archaeological Survey of Ceylon**, (Colombo: Annual Report, Department of Archaeological Survey of Sri Lanka. 1907), 14 p

19 D.T.Devendra, **The standing figure at the gal vihara**, (polonnaruva: sir paul peries volume, 1956).

20 Ceylon jurnal of science, vol. 11, 15



**යාපහුව විහාරයේ හමුවන සිතුවම**



**යටාල විහාරයෙන් හමුවන ප්‍රතිමාව**

උපුටා ගැනීම: Prematilleke,1966, 64

ලක්දිව කලා සම්ප්‍රදාය තුළ පද්මාසනය පමුණුවනු ලබන්නේ බුදුන්ට හා දෙවිවරුන්ට පමණක් වන බවත් බුද්ධ ශ්‍රාවකයන් සඳහා පද්මාසනය පමුණුවනු නො ලැබූ බවත් ඔහු විසින් පෙන්වා දෙනු ලැබේ. එමෙන් ම පිළිමයේ ඇති ශාරීරික මහාපුරුෂ ලක්ෂණ අනුව ද මෙය බුද්ධ රූපයක් ම වන බව පෙන්වා දෙන පරණවිතාන බුද්ධ ප්‍රතිමාවේ සිරස්පත පැවති බවට සළකුණු පෙන්වා දේ.[21] එමෙන් ම මෙම පිළිමයේ තොල්වලින් මන්දස්මිතය ප්‍රකාශ කරන බවත් එයින් ශෝකය ගම්‍යමාන නොවන බවත් විචාරකයන්ගේ මතය වේ.[22]

කෙසේ වෙතත් අද වන විට බහුතර විද්වත් මතය වී ඇත්තේ මෙය බුද්ධ ප්‍රතිමාවක් වන බවයි.ප්‍රතිමාවේ හස්ත මුද්‍රාව පිළිබඳ ව ද විවිධ අදහස් පළ වී තිබේ. දෙඅත් පපුව මත තබා බැද සිටින ඉරියව්ව ගල් විහාරයේ හිටි ප්‍රතිමාවට අමතර ව පොළොන්නරුවෙන් හමුවන තවත් හිටි පිළිමයක, යටාල කෞතුකාගාරයේ ප්‍රතිමාවක් ද දඹුල්ල අංක 2 ලෙන් විහාර ප්‍රතිමාව ද හිඳගල හා තෝරගල්ල ප්‍රතිමාවල ද හඳුනාගත හැකි ය.[23] ධම්මපදයේ සඳහන් වන ආකාරයට බුදුන් වහන්සේ ප්‍රඥාව නමැති ප්‍රසාදයට නැග පහළ දුක්විඳින අය දෙස කරුණාවෙන් බලා සිටින ආකාරය මෙම ප්‍රතිමාවෙන් නිරූපණය කරන බව කියවේ.[24] පරණවිතාන පෙන්වා දෙන ආකාරයට මෙය පරදුක්ඛදුක්ඛිත මුද්‍රාවයි.[25] මහාචාර්ය විමල විජයසූරිය හා ගුණපාල සේනාධීර ප්‍රකාශ කරන ආකාරයට මෙය ස්වස්ථික මුද්‍රාවයි. නමුත් ස්වස්ථික මුද්‍රාව දක්වන්නේ අත්දෙක මැණික්කටුව ළගින් හරහට තබා දෙ අල්ල ඉදිරියට හරවා තබා ගනිමිනි. එම නිසා ඔවුන්ගේ මෙම අර්ථකථනය නිවැරදි නො වන බවයි වික්‍රමගමගේගේ අදහස වන්නේ.[26] ටී. ආර්. ප්‍රේමතිලක විසින් මෙම මුද්‍රාව අනිමිස ලෝචන මුද්‍රාව ලෙසින් හඳුන්වා දෙයි.[27]මෙය වජ්‍රහූංකාර මුද්‍රාව බව අනුර මණතුංග මතයක් පල කරන නමුත් වික්‍රමගමගේගේ කරුණු දැක්වීමට අනුව එය ද නිවැරදි අර්ථ දැක්වීමක් නො වේ. වජ්‍රහූංකාර මුද්‍රාව දක්වන්නේ දැත් මැණික්කටුව ළගින් හරහට තබා

21 S. Paranavithana, **Art of Ancient Sinhalese**, (Colombo, 1971). 573" 126 notas.

22 සී. වික්‍රමගමගේ, **පොළොන්නරුවේ ගල්විහාරය**, (කර්තෘ ප්‍රකාශනයකි 2011).17 පිට.

23 ඩී. ගම්ලත්,,**බුද්ධ ප්‍රතිමාගෘහයේ අවකාශීය සංවිධානය**, (කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම, පී. ද ඇස්. කුලරත්න මාවත, 2016).687 පිට.

24 සී. වික්‍රමගමගේ, **පොළොන්නරුවේ ගල්විහාරය**, (කර්තෘ ප්‍රකාශනයකි 2011) 15 පිට.

25 S. Paranavithana, **Art of Ancient Sinhalese**, (Colombo, 1971) 573, 126 notes.

26 සී. වික්‍රමගමගේ, **පොළොන්නරුවේ ගල්විහාරය**, (කර්තෘ ප්‍රකාශනයකි 2011) 15 පිට.

27 L. Prematillake, **The identity and significance of the standing figure at the gal vihara, polonnaruva, ceylon.**, (Artibus Asiae,vol.28,no.1,Artibus asiae publishers1966). 61-66.pp

එක් අතකින් වජ්‍රයත් අනෙක් අතින් සණ්ඨාවත් රැගෙන ය.[28] වික්‍රමගමගේට අනුව ගල් විහාර හිටි පිළිමයේ හස්ත මුද්‍රාව බුදු පිළිමවලට පමණක් සුවිශේෂී වූවක් නො වේ. මෙයට සමාන මුද්‍රාවක් සහිත සිතුවම් පොළොන්නරුවේ තිවංක පිළිමගෙයින් හමු වේ. එහි ආසංකවතී ජාතක චිත්‍ර අතර ආසංකවතී හා තාපසයා මෙම මුද්‍රාවෙන් දෑත් තබාගෙන සිටිනු දැකිය හැකි ය. ඊට අමතර ව යටාල වෙහෙර කෞතුකාගාරයේ හිසසුන් බුදු පිළිමයක ද යාපහුව විහාර සිතුවම් වල ද දඹුල්ල විහාරයේ බුද්ධ රූප සහිත ඇතැම් සිතුවම්වල ද මෙම මුද්‍රාව ප්‍රකාශිත බවත් එම සියල්ල ම පාහේ අවධානය ප්‍රකාශ කරන මුහුණකින් යුතු බවත් එබැවින් මෙම මුද්‍රාව අවධාන මුද්‍රාව ලෙස හඳුනාගත හැකි යුතු බවත් වික්‍රමගමගේගේ මතය වී තිබේ.[29]

## සැතපෙන ප්‍රතිමාගෘහය

හිටි පිළිම ගෙයට යාබද ව නිර්මාණය කර තිබෙන මෙම සැතපෙන පිළිමය සහිත ගෘහය මහාවංසය හඳුන්වා ඇත්තේ නිපන්නපටිමාගුහා යන නමිනි.[30] සැතපෙන පිළිමයේ හිසට ආසන්නයෙන් බඳින ලද ගඩොල් බැම්මක් මඟින් හිටි පිළිමය හා මෙම සැතපෙන පිළිමය වෙන් කොට වෙන ම ප්‍රතිමාගෘහ කරවා තිබේ. බෙල් පවසන ආකාරයට මෙම හරස් බිත්ති පසුව බඳින ලද ඒවා වන අතර ප්‍රතිමා ද්විත්වය ම තනි ගොඩනැගිල්ලක ලෙස මුලදී පවතින්නට ඇත. දිගින් වැඩි පළලින් අඩු තනි විහාරයක් ව පැවති මෙයට පිළිම ද්විත්වය සඳහා වෙන ම දොරටු මණ්ඩප හා ආලින්ද පවතින්නට ඇති බව ඔහුගේ අදහසයි.[31] නමුත් මෙම ගඩොල් බැම්ම පසුව එකතු කරන ලද්දක් නොවන බව එහි අත්තිවාරම් හා ගඩොල් බැම්මේ ඉදිකිරීම් ක්‍රමය අනුව කිව හැකි ය. ඒ අනුව මෙම ප්‍රතිමා ගෘහ තනි වහළක් සහිත ව වෙන් කරන ලද ප්‍රතිමාගෘහ දෙකක් වශයෙන් පවතින්නට ඇතැයි උපකල්පනය කළ හැකි වේ.

නමුත් පරනවිතානගේ අදහස වන්නේ මෙම සැතපෙන පිළිමය කරවන විටත් හිටි පිළිමය පවතින්නට ඇති බවයි. මෙම අදහසට සාධක පෙන්වන පරණවිතානයන් මහාවංසයේ මෙම හිටි පිළිමය පිළිබඳ සඳහන් නො වන්නේ ද පළමු වැනි පරාක්‍රමබාහු විසින් උත්තරාරාමය කරවන විටත් හිටි පිළිමය වන්දනාමාන කෙරෙන තත්ත්වයේ පැවති හෙයින් බව පෙන්වා දේ. එබැවින් උත්තරාරාමයේ හිටි ප්‍රතිමාව වනාහී පළමු වැනි පරාක්‍රමබාහු රජුට පූර්වතමයෙකුගේ නිර්මාණයක් විය යුතු ය.[32] නමුත් මෙම අදහස සනාථ කරන පුරාවිද්‍යාත්මක සාධක හෝ මූලාශ්‍රමය සාධක හමු නොවන බැවින් ගල්විහාර කතිකාවත ශිලාලිපියට අනුව මෙම සමස්ත උත්තරාරාම විහාරය සැලැස්ම ම පළමු වැනි පරාක්‍රමබාහුගේ නිර්මාණයක් ලෙසින් සැළකීම සාධාරණ ය.

ගල් විහාර සැතපෙන ප්‍රතිමාව දිගින් මීටර් 13.9 වන අතර එහි ආසනය මීටර් 16.9 කි. පර්වතයේ ශේෂ කොටසේ උස ප්‍රමාණවත් නො වීම තුළ ආසනය සම්පූර්ණයෙන් ම ඉදි කිරීමට අපොහොසත් වී ඇති අතර බුදුන් වහන්සේ දුහුල් ඇතිරිල්ලක් මත සැතපී සිටින ආකාරයට නිරූපණය කර තිබේ. මෙම සැතපෙන ප්‍රතිමාවෙන් නිරූපණය කරන්නේ බුදු හිමියන්ගේ පරිණිර්වාණ අවස්ථාව බව පී.එල්. ප්‍රේමතිලක වැනි විද්වතුන්ගේ මතයයි.[33] මෙම අදහසට හේතු සාධක ලෙස දකුණු ඇලයෙන් සිටින ප්‍රතිමාවේ වම් පය තරමක් පිටුපසට වන සේ ඉදිරිපත් කිරීම පෙන්වා දේ. නමුත් මෙම අදහසට පරස්පර අදහස් දක්වන වික්‍රමගමගේ පෙන්වා දෙන්නේ බුදුන් වහන්සේ පිරිනිවන් අවස්ථාවේ මෙන් ම සැතපෙන අවස්ථාවේ දී ද එක් පයක් පසුපසට ඇද තබාගෙන සැතපුන බවත් එයට හේතුව පයේ ඇස්වට හන්දි එකට ගැටීමෙන් ඇතිවන වේදනාව නින්දට බාධාවක් වන බැවින් බවත් ය. එම නිසා මෙම ලක්ෂණය පිරිනිවන් මඤ්චකයට පමණක් සුවිශේෂී නොවන අතර අනුරාධපුර හා පොළොන්නරු

28 සී. වික්‍රමගමගේ, පොළොන්නරුවේ ගල්විහාරය, (කර්තෘ ප්‍රකාශනයකි 2011) , 15 පිට

29 එම., 17 පිට.

30 මහාවංසය (සංස්:) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි,(කොළඹ: සංස්. අමාත්‍යංශය,1986) 78 පරි., 78-81 ගාථා.

31 H.C.P.Bell, **Archaeological Survey of Ceylon**, (Colombo: Annual Report, Department of Archaeological Survey of Sri Lanka. 1907) 13.pp

32 S. Paranavithana, **Art of Ancient Sinhalese**, (Colombo, 1971) 572, 124 notes

33 ඩී. ගම්ලත්, **බුද්ධ ප්‍රතිමාගෘහයේ අවකාශීය සංවිධානය**, (කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම, පී. ද ඇස්. කුලරත්න මාවත, 2016), 688 පිට.

යුගවල සැතපෙන ප්‍රතිමාවල සැතපෙන ඉරියව්ව දැක්වීමේ දී ද පයක් පසුපසට ඇද තබාගෙන සිටින ඉරියව්ව නිරූපිත බව හෙතෙම තවදුරටත් පෙන්වා දෙයි. එමෙන් ම මහනුවර යුගයේ සැතපෙන ප්‍රතිමාවල පාද එක මට්ටමකට ගෙන නිර්මාණය කර තිබෙන්නේ නිර්මාණකරුවාගේ නොදැනුවත්භාවය නිසා බවයි එතුමා පවසන්නේ.[34]

ප්‍රතිමාව මුහුණලන්නේ දකුණු නැගෙනහිර දිශාවට වන අතර හිස යොමුවන්නේ දකුණු බටහිර දිශාවට ය. මේ අනුව සැතපෙන ඉරියව්වට වඩා පිරිනිවන් ඉරියව්ව මින් නිරූපණය කරන බවයි ගම්ලත්ගේ අදහස වන්නේ.[35] සැතපෙන පිළිමයේ සිරිපතුල් සඳහා තුනී ඇතිරිල්ලක් යොදා තිබේ. එය තන්තිරිමලේ සැතපෙන ප්‍රතිමාවට සමාන ලක්ෂණයකි.

ප්‍රතිමාගෘහය තුළ ගර්භසරයේ අභ්‍යන්තරය ආයතස්‍රාකාර හැඩයක් ගන්නා අතර එය දිගින් මීටර් 13.75 ක් ද පළලින් මීටර් 4.6 ක් ද වේ. ගර්භසරයට ඉදිරියෙන් පටු ආලින්දයකි. බිත්තිය මීටර් 1.45 ඝනකමින් යුත් මෙහි දිග මීටර් 2.85 ක් ද පළල මීටර් 2.9 ක් ද වේ. ප්‍රතිමාව සහිත ගර්භසරයට වඩා පහළින් මණ්ඩපය පිහිටා තිබේ. බෙල්ගේ අදහස අනුව මෙම ප්‍රතිමාගෘහයට තිබී ඇත්තේ දාරුමය වහළකි.[36] හිටි පිළිමය දිගින් වැඩි නිසා එහි වහළයට මෙම වහළය සම්බන්ධ කිරීම අසීරු බව සඳහන් කරමින් හෙතෙම එසේ කියයි. එයට ගැළපෙන සාධක ලෙස අඩි 8.2 පමණ උසින් යුත් ගල් කණු 12 කට වැඩි ප්‍රමාණයක් පේළි 2 කට වන ආකාරයෙන් මෙහි සිටුවා පැවති බව බෙල් පවසයි. ඔහු පවසන ආකාරයෙන් ගල් කණු පැවති බවට පැහැදිලි සාධක ලෙස කණු වල අදටත් ශේෂ ව පවතී. මෙම සාධක අනුව දාරුමය වහළක් පැවති බව තහවුරු වන නමුදු එම ඉදි කිරීම උත්තරාරාමය ඉදිකරන මුල් අවස්ථාවේ දී රජු විසින් ම කරවන ලද්දක් ලෙස පිළිගන්නට බොහෝ දෙනා මැලි වේ. එයට හේතුව ලෙසින් ඔවුන් දක්වන්නේ මෙම ඉදිකිරීම මඟින් ගර්භසරය පමණක් ආවරණය වන නමුත් අන්තරාලය හා මණ්ඩපය ද ඇතුළු සමස්ත ගොඩනැගිල්ල ම ආවරණය නොවන බවයි. එබැවින් මෙය ගෙඩිගෙය විනාශ වී යාමෙන් අනතුරු ව පසු කාලීනව සිදු කරන ලද නිර්මාණයන් විය හැකි බවත් එය බොහෝ විට දඹදෙණි අවධියේ සිවු වැනි විජයබාහු රජුගේ නිර්මාණයක් විය හැකි බවත් උපකල්පනය කෙරේ.

සමස්තයක් ලෙස පොළොන්නරු යුගයේ බුද්ධ ප්‍රතිමා ශිලාමය, ගඩොල් හා බදාම සහ ලෝහවලින් කරවන ලද ඒවා බහුල වශයෙන් හමු වේ. ඒවා වැඩ සිටින ප්‍රතිමා, හිටි ප්‍රතිමා සහ සැතපෙන ප්‍රතිමා වශයෙන් වර්ග තුනකි. මේ අතර ඉතා විශාල ප්‍රමාණයේ නිදර්ශක හමුවන සුවිශේෂී ස්ථානයක් වශයෙනි ගල් විහාරය හඳුනාගත හැක්කේ. නිර්මාණ සංකල්පයෙන් මෙන් ම කලා සම්ප්‍රදායෙන් ද මෙම ප්‍රතිමා ඉන් පෙර යුගයේ බුද්ධ ප්‍රතිමාවලට වඩා බෙහෙවින් වෙනස් ය.[37] අනුරාධපුර අවධියේ ප්‍රතිමාවල මෙන් බුදුන්ගේ මහා ප්‍රඥාව හා මහා කරුණාව වැනි අභ්‍යන්තර ගුණයන් පොළොන්නරු කලා ශිල්පියා විසින් මැනවින් හෙළිදරව් නොකරනු ලබයි. එහෙයින් නිර්මාණ සංකල්පය අතින් බලන විට බෙහෙවින් වෙනස් බව පැහැදිලි ය. පොළොන්නරු යුගයේ බුද්ධ ප්‍රතිමාවල ආධ්‍යාත්මික ප්‍රබෝධතා දක්වන ලක්ෂණ බෙහෙවින් අඩු ය. එබැවින් අනුරාධපුර අවධියේ තරම් උසස් කලා කෘති ලෙස පොළොන්නරු යුගයේ කලාකෘති ගිණිය නො හැකි බව බස්නායකගේ මතය වේ.

පොළොන්නරු ගල්විහාරයේ විජ්ජාධර ගුහාවේ හිදි ප්‍රතිමාවෙහි මුහුණ තුළින් නීරස, උදාසීන, අකාරුණික, රළු ස්වරූපයක් ඉස්මතු වන බව බස්නායක පවසයි.[38] අනුරාධපුර ප්‍රතිමා මෙන් ශාන්ත, නිශ්චල, සෞම්‍ය හා තෘප්තිමත් ගති ලක්ෂණ මෙම අවධියේ ප්‍රතිමාවල නොමැති බව අගවන්නට ඔහු බෙහෙවින් ම උත්සහ කරයි. ඒ හැරුණු කොට අණ්ඩාකාර හැඩයට සමීප වූ හිසෙහි හැඩය නිසා තවදුරටත් බුද්ධ රූපයේ රමණීයත්වය හා අලංකාරය හීන වී ඇත.[39] ඔහු තවදුරටත් පවසන්නේ මෙම

34 සී. වික්‍රමගමගේ, **පොළොන්නරුවේ ගල්විහාරය**, (කර්තෘ ප්‍රකාශනයකි 2011) , 17-18 පිට

35 ඩී. ගම්ලත්, **බුද්ධ ප්‍රතිමාගෘහයේ අවකාශීය සංවිධානය**, (කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම, පී. ද ඇස්. කුලරත්න මාවත, 2016), 688 පිට

36 H.C.P.Bell,**Archaeological Survey of Ceylon**,(Colombo: Annual Report, Department of Archaeological Survey of Sri Lanka. 1907), 15.p

37 **ලංකාවේ මූර්ති ශිල්පය** මූර්ති කලාව (සංස්.) එස්.ටී. බස්නායක ,එන්.විජේසේකර,(හතර වන වෙළුම 1990 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව), 97 පිට.

38 එම.,97 පිට.

39 එම, 98 පිට.

හැඩය බුදුන්ගේ අතිමානුෂික ලක්ෂණයන්ට කිසිසේත් ම නො ගැළපෙන බවත් ඒ නිසා බුදුන්ගේ ශ්‍රේෂ්ඨ ගුණ ප්‍රකාශනයට ඉමහත් බාධාවක් ඇති වන බවයි. මෙය සැදැහැවතුන්ගේ ශ්‍රද්ධාව ඇති කරවන්නට සමත් ලක්ෂණයක් නොවේ.

නමුත් විජ්ජාධර ගුහාවේ හිඳි ප්‍රතිමාවට සාපේක්ෂ ව ලෙනෙහි බුද්ධ ප්‍රතිමාවෙහි මුහුණ දැකුම්කළු ය. ප්‍රසන්න ය. ශාන්ත ය. හිසෙහි අණ්ඩාකාර ස්වරූපය කැපී පෙනෙන අයුරින් නිරූපිත නොමැති අතර ශාරීරික අවයවයන්ගේ සමබරතාවය හා සමප්‍රමාණානුකූලභාවය ස්වභාවික අයුරින් නිරූපණය කර තිබේ. එබැවින් ලෙනෙහි ප්‍රතිමාව ආකෘතික නිමාව අතින් අනුරාධපුර ප්‍රතිමාවන්ට සමානකමක් දක්වයි.[40]

කෙසේ නමුත් ගල්විහාර ප්‍රතිමා අනුරාධපුර අවධියේ ප්‍රතිමා තරම් කලාත්මකබවින් උසස් නොවුණ ද අනුරාධපුර අවධියේ තරම් ප්‍රතිමා නිර්මාණය හා කර්මාන්ත කුසලතාවය අතින් දුර්වල වුව ද හැඩග ැන්වීම්, නෙලීම් හා ආකෘතික නිමාව අතින් උසස් ගණයේ ලා සැළකිය යුතු ය.

පොළොන්නරු ගල්විහාර වැඩහුන් පිළිමවල දැකිය හැකි මනස්කාන්ත ලක්ෂණයක් ලෙස පිටුපස නිමවා ඇති තොරණ පෙන්වා දිය හැකි ය. බුදු පිළිමයේ පූජනීයත්වය හා ශෝබනත්වය වර්ධනය කිරීම සඳහා එය කදිම උපක්‍රමයකි. මෙය විසින් ප්‍රතිමාවේ පෙර කී දුර්වලතා ඉස්මතු නො කරන්නට සමත් වෙයි. මෙම තොරණ මඟින් බුදුරුවට දාර්ශනික බවක් හා ශ්‍රේෂ්ඨබවත් එක් කරයි. විජ්ජාධර ගුහාවේ තොරණ සාංචි තොරණට සමාන වුව ද කැටයම් වෙනස් ය. ආසනයේ කැටයම් පවා ගුප්ත දාර්ශනික අදහස් ඉස්මතු කිරීම වෙනුවෙන් යෙදූ ඒවා විය හැකි ය. ලෙන තුළ ප්‍රතිමාවේ තොරණ විජ්ජාධර ගුහාවේ තොරණට වඩා වෙනස් වේ. එය සැරසිලි කිරීම සඳහා මානව රූප හා සත්ත්ව රූප යොදා ගෙන ඇති අතර ඒවා ද බුද්ධ ප්‍රතිමාවට සරිලන සමතාවයකින් හා පරිමාණුකූල ව නිමවා තිබේ. මෙම ලක්ෂණ දෙස බලන විට ලෙන තුළ ප්‍රතිමාකරණය වනාහී මූර්තිකලාව හා ඒ ගල් කැටයම් කර්මාන්තය කෙරෙහි ශිල්පීය නිපුණයෙකුගේ කාර්යයක් බව පැහැදිලි කරන කලාගාරයක් බඳු ය. ඒවයේ මනහර ඉරියව්, අවයවවල සියුම් නිමාව, ඇඳුම් පැළඳුම්වල කලාත්මකභාවය ආදිය මඟින් නිර්මාණ ශිල්පියාගේ දස්කම් සුළුපටු නොවන බව පිළිබිඹු කෙරෙන බව පරණවිතානයන් පවසයි.

පී.ඊ.ප්‍රනාන්දු පවසන ආකාරයට මෙම ප්‍රතිමා දෙක තන්ත්‍රවාදීන්ගේ බලපෑම මතසිංහල කලා ශිල්පීන් විසින් තනන ලද ඒවා ය.[41] නමුත් මෙම මතයට එකඟ නොවන නන්දසේන මුදියන්සේ එම කාල පරිච්ඡේදය තුළ ලක්දිව තන්ත්‍රවාදය ක්‍රියාත්මක නොවූ බව පෙන්වා දෙයි.[42] කෙසේ වෙතත් ගල්විහාරයේ ප්‍රතිමාවල සැරසිලි යෙදීම සැදැහැවතුන්ගේ ශ්‍රද්ධාව වර්ධනය කිරීම උදෙසා කළ ඒවා බව සැළකීම මෙහි ප්‍රමාණවත් ය.

## ගල්විහාර ශිලාලිපිය

පළමු වැනි පරාක්‍රමබාහු රජ සමයේ සිදු කරන ලද ශාසනික සේවාවන් අතර සංඝයා අතර සමගියක් ඇති කරනු වස් භික්ෂූන් ධර්මාධිකරණයට කැඳ වූ බව මහාවංසයේ කිය වේ.[43] දිඹුලාගල කාශ්‍යප මහ තෙරුන් ප්‍රධාන කොටගත් ධර්මාධිකරණයට පමුණුවීමෙන් අනතුරු ව දුස්සීල භික්ෂූන් පළවා හැර විනය නගා සිටවූ බව වංසකතා ආදී මූලාශ්‍රවලින් හෙලි වේ.[44] අනතුරුව මේ මහා සංඝ සංශෝධනය පිළිබඳ රජුගේ නියමයෙන් උත්තරාරාමයේ ගලක කොටවා ආඥා පැනවූ අතර එය ගල්විහාර කතිකාවත යනුවෙන් අද හැඳින්වේ. මෙම ලිපිය පේළි 51 කින් යුක්ත අඩි 13 ක් පමණ උසින් යුත් ශිලා ලිපියකි.[45]

---

40 ලංකාවේ **මූර්ති ශිල්පය** මූර්ති කලාව (සංස්.) එස්.ටී. බස්නායක , එන්.විජේසේකර,(හතර වන වෙළුම 1990 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව), 98 පිට.

41 එම., 99 පිට.

42 මුදියන්සේ, 1967, 107

43 **මහාවංසය** (සිංහල) (සංස්:) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, (කොළඹ: සංස්කෘතික අමාත්‍යංශය, 1986)., 78 පරි., 1-10 ගාථා.

44 ඒ. ලගමුව, **මධ්‍යකාලීන රාජධානිය පොළොන්නරුව**, (කොළඹ: සරසවි ප්‍රකාශකයෝ, 1999), 147පිට.

45 D.M. De. Z. Wickramasinghe, **Epigraphia Zeylanica Vol.ii.**, (London: Published for the Government of Ceylon, Oxford University Press, 1928), 256p.

## සමෝධානය

ඉහත කී කරුණු කාරණා අනුව ගල්විහාරය හෙවත් පුරාණ උත්තරාරාමය යනු මධ්‍යකාලීන ලංකාවේ ශාසනික ඉතිහාසය හා ලාංකීය කලා ශිල්පීන්ගේ සුවිශේෂී ලක්ෂණයන් පිළිබිඹු කරන අතිශයින් වැදගත් පුරාවිද්‍යා ස්ථානයක් ලෙස සැළකිය හැකි ය.